අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/08/01 — ඔබේ යොමුව / உமது இல. / Your Ref. — දිනය / திகதி / Date 2025.07.07

චක්‍රලේඛ අංක : 23/2025

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේණාධිපති/කෘත්‍යාධිකාරී හිමිවරුන්
සියලු ම රජයේ පාසල්වල විදුහල්පතිවරුන් වෙත

**<u>රජයේ පාසල්වල සපයන ජලය සඳහා ජල බිල්පත් ගෙවීම</u>**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජලය සපයනු ලබන ජාතික හා පළාත් පාසල්වල ජල බිල්පත් ගෙවීම සම්බන්ධව නිකුත් කර ඇති අංක අමප/23/1071/607/090 සහ 2023.07.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජයේ පාසල්වලට සපයන ජලය සඳහා බිල්පත් ගෙවීමට අදාළව මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන 2025.01.01 සිට අදාළ වේ.

2. ඒ අනුව රජයේ පාසල්වල සහ පිරිවෙන්වල ශිෂ්‍යයෙකුට, අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයෙකුට දිනකට ජලය ලීටර් 20ක් පරිභෝජනය කිරීම සම්මතය ලෙස ගෙන මසකට දින 20ක් ලෙස සලකා එක් අයෙකුගේ මාසික ජල පරිභෝජනය ලීටර් 400ක් ලෙස සම්මත ජල පරිභෝජනය ගණනය කරනු ලැබේ. මෙම පදනම මත පාසලක ජල පරිභෝජනය ගණනය කොට මාසිකව සම්මත ජල පරිභෝජනය වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු රජය විසින් දරනු ලැබේ.

3. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සපයන ජලය සඳහා ගාස්තු අය කිරීමේ දී ඉහත ගණනය කිරීම අනුව රජය විසින් දරනු ලබන ජල ගාස්තු රජයේ දායකත්වය (Govt contribution) යන ශීර්ෂය යටතේ ද, අමතර ජල ප්‍රමාණයක් පරිභෝජනය කර ඇත්නම් ඊට අදාළ ගාස්තු අමතර ගාස්තුව (Extra Charges to School) යන ශීර්ෂය යටතේ ද මාසික ජල බිල්පතෙහි සඳහන් කර ඇත.

4. ජල බිල්පතේ සඳහන් රජයේ දායකත්වය යටතේ ඇති ගාස්තු (Govt contribution) ජාතික පාසලක් නම් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ද, පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ද ගෙවීම් කරනු ලබන අතර අමතර ගාස්තුව (Extra Charges to School) යටතේ ඇති මුදල පාසල් සංවර්ධන සමිතිය මගින් ද පිරිවෙනක් නම් වාර්ෂික ආධාර මුදල/ පිරිවෙන් සංවර්ධන අරමුදල මගින් ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවීම් කළ යුතුය. කිසියම් පාසලක ජල බිල්පතෙහි රජයේ දායකත්වය (Govt contribution) යටතේ පමණක් ගාස්තු දක්වා ඇත්නම් එම මුදල පාසල මගින් ගෙවීම අවශ්‍යය නොවේ.



CamScanner

5. පාසල් ජල සැපයුම පිළිබඳව දැනුවත් විය යුතු ප්‍රධාන කරුණු පහත පරිදි වේ.

5.1 පාසලේ විදුහල්පති නිවාස හා ගුරු නිවාස, පිහිණුම් තටාක වැනි සුවිශේෂ ජල අවශ්‍යතා සඳහා වෙන් වෙන් ව ජල සැපයුම් සම්බන්ධතා ලබා ගත යුතු ය. මේ දක්වා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් කිසිදු ජල සැපයුම් සම්බන්ධතාවයක් ලබා නොමැති පාසල්/පිරිවෙන් සඳහා එක් පොදු ජල සම්බන්ධතාවයක් පමණක් සම්බන්ධතා ගාස්තු අය කිරීමෙන් තොරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ලබා දෙනු ලැබේ.

5.2 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල බිල්පත් සැකසීමේ දී අවශ්‍ය වන පාසල් දත්ත විදුහල්පති විසින් නිවැරදිව සකස් කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉල්ලා සිටින අවස්ථාවේ දී ඔවුන් වෙත ලබා දිය යුතු ය.

උදා:- ශිෂ්‍ය සංඛ්‍යාව, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව, බිල්පත යොමු විය යුතු whatsapp දුරකතන අංකය හා ඊ මේල් ලිපිනය ආදී

තව ද, මාසික ජල පරිභෝජන බිල්පත් ගෙවීම් සනාථ කිරීම සඳහා පාසල වෙත කෙටි පණිවුඩයක් (SMS) දුරකතන මාර්ගයෙන් යොමු කරන බැවින් ජංගම දුරකතන අංකයෙහි යම් වෙනසක් වේ නම් ඒ බව නොපමාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය දැනුවත් කළ යුතුය

5.3 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් පාසලට යොමු කරන විද්‍යුත් බිල්පත්හි (e – bills) මුද්‍රිත පිටපත් නියමිත පරිදි ගොනුගත කර තබා ගත යුතු ය.

5.4 ජල බිල්පත ගණනය කිරීමේ දී යම් පාසලක් සම්මත ජල පරිභෝජනය ඉක්මවන අවස්ථාවක දී (එනම් එක් අයෙකුගේ ජල පරිභෝජනය මසකට ලීටර් 400 බැගින් අනුමත පුද්ගල සංඛ්‍යාවට පාසලට හිමි සම්මත ජල පරිභෝජනය ඉක්මවා යන විට) එම අමතර ජල ගාස්තුව (Extra Charges to School) ගෙවීම සඳහා අදාළ පාසලේ සංවර්ධන සමිතිය/ පිරිවෙන් වාර්ෂික ආධාර මුදල/ පිරිවෙන් සංවර්ධන අරමුදල මගින් වියදම දැරිය යුතුය. මේ සඳහා වන වැය වෙන් කිරීම පාසලේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කළ යුතු වේ.

5.5 පාසලේ විදුහල්පති නිවාස, ගුරු නිවාස, සඳහා වෙන් වෙන් ව ජල සම්බන්ධතා ලබා දී ඇති අවස්ථාවල ජල බිල්පත් නිවාස වල පදිංචි නිලධාරීන් විසින් ගෙවිය යුතු ය. පිහිණුම් තටාක සඳහා අය කරන ජල බිල්පත් තටාක ආශ්‍රිතව ලැබෙන ආදායමෙන් ගෙවිය හැකිය.

5.6 2023 වර්ෂයේ ජූනි 01 සිට 2024 වර්ෂයේ දෙසැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදයට අදාළ හිඟ ජල බිල්පත් ගෙවීමේ දී රජයේ දායකත්වයට අදාළ ගාස්තුව (Govt contribution) ජාතික පාසලක් නම් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ද, පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ද ගෙවනු ලබන අතර, රජයේ දායකත්වය ඉක්මවා සිදු කළ අමතර ජල පරිභෝජනය සඳහා (Extra Charges to School) අය කිරීමක් බිල්පතෙහි සඳහන්ව ඇත්නම් එම මුදල පාසල් සංවර්ධන සමිතිය/ පිරිවෙන් වාර්ෂික ආධාර මුදල/ පිරිවෙන් සංවර්ධන අරමුදල මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවිය යුතුය. එසේ මුදල් එකවර ගෙවීමේ දී යම් පාසලකට මූල්‍යමය අපහසුතාවයක් පවතීනම් ඒ පිළිබඳ ව තම පාසලට අදාළ ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරණ කාර්යාලවල හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල වාණිජ නිලධාරීන් හමු වී සහන කාලයක් ලබා ගැනීමට ඉල්ලීම් කළ හැක. පාසල විසින් ගෙවිය යුතු හිඟ බිල්පත් ගාස්තු පිළිබඳව ද මෙම කාර්යාලවලින් තොරතුරු ලබා ගත හැකිය.

CamScanner

5.7 සම්මත ජල පරිභෝජනය ඉක්මවා ජලය පරිභෝජනය කරන පාසල් ජල සංරක්ෂණය, ජලය ප්‍රතිචක්‍රීකරණය හා නළ ළිං වැනි විකල්ප ජල සම්පාදන ක්‍රම හඳුන්වා දීම ආදිය මඟින් ජල ගාස්තු අඩු කර ගැනීමට කටයුතු කළ යුතු ය. පාසල් පරිශ්‍රය තුළ ඇති ජල නල වලට හානී වීම හා කාන්දු වීම නිසා සිදුවන ජලය අපතේ යාම වළක්වා ගැනීමට පාසල් පරිපාලනය වග බලා ගත යුතුය. ජලය අරපිරිමැස්මෙන් පරිභෝජනය කිරීම හා ජල සංරක්ෂණයේ ඇති වැදගත්කම සම්බන්ධයෙන් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් විදුහල්පතිවරුන් විසින් සංවිධානය කළ යුතු අතර නිරන්තර පසු විපරම් කළ යුතුය.

6. පිරිපහදු කරන ලද ජලය සැපයීම සඳහා ජල සම්පාදන මණ්ඩලය මඟින් විශාල මුදලක් වැය කරන අතර පාසල්වලින් අය කරනු ලබන්නේ සහන ගාස්තුවකි. සීමිත ජල සම්පත රැක ගැනීමත්, ජාතික ධනය ඵලදායී ලෙස භාවිත කිරීමත් කෙරෙහි වැඩි අවධානයක් යොමුකරමින්, මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බව වැඩි දුරටත් දන්වමි.

නාලක කළුවැව
ලේකම්

පිටපත

01. ලේකම්, නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය - අ.ක.ස / දැ.ගැ.ස.
02. සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - අ.ක.ස / දැ.ගැ.ස.

CamScanner